අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 03/2024

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර,වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) වාර්ෂික ස්ථානමාරු හා වාර්ෂික ස්ථානමාරු අභියාචනා නියෝග අනුව ක්‍රියා නොකිරීම**

ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් වාර්ෂික ස්ථානමාරු නියෝග අනුව නව සේවා ස්ථානවල රාජකාරියට වාර්තා කිරීම සඳහා නිලධාරීන් මුදා හැර නොමැති අවස්ථා පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත කරුණු වාර්තා වී ඇත.

02. නියමිත දිනට නිලධාරීන් මුදා නොහැරීම, උග්‍ර සේවක ඌනතාවයක් පවතින මෙවැනි අවස්ථාවක දී අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන මානව සම්පත් කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමට බාධාවක් වන අතර, එය සමස්ත අධිකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව පවත්වාගෙන යෑම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. නියමිත දිනට නිලධාරීන් මුදා නොහැරීම වාර්ෂික ස්ථානමාරු නියෝග පැහැර හැරීමක් බව අවධාරණය කරමි.

03. එබැවින් ස්ථානමාරු නියෝගවලට පටහැනිව, තවදුරටත් නිලධාරීන් මුදා නොහැර රඳවා ගෙන සිටීනම් එම සියලු නිලධාරීන් නියමිත අධිකරණවල සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි වහාම මුදා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඔබට දැන්වීමට අධිකරණ සේවා කොමිෂන් සභාව මට නියම කර ඇත.

04. තව ද ස්ථාන මාරු නියෝග අනුව නිලධාරීන් මුදා හැරීමට ක්‍රියාකර නොමැති අවස්ථා ඇත්නම් ඒ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමටත් අධිකරණ සේවා කොමිෂන් සභාව මට නියම කර ඇත.

05. ස්ථානමාරු නියෝග අනුව නිලධාරීන් මුදා හැරීමෙන් පසු ඔබ අධිකරණයට අදාළව මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු පවතීනම් ඒ පිළිබඳව ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත වැඩිදුරටත් දන්වා සිටිමි.

06. මේ හා සබැඳිව අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2008 ජනවාරි 08 දිනැති "මානව සම්පත් කළමණාකරණය - 2008" චක්‍රලේඛ ලිපිය වෙත ඔබේ අවධානය යොමු කරමි.

එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 පෙබරවාරි මස 16 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.